# මුදල් අමාත්‍යාංශය

## සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය

## පුරප්පාඩු

මුදල් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන, සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතියේ පවතින පහත සඳහන් පුරප්පාඩුව සඳහා, සුදුසුකම්ලත් හා පළපුරුදු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

| තනතුර | සුදුසුකම් |
|---|---|
| 1. රියදුරු (පුරප්පාඩු එකකි) III ශ්‍රේණිය PL – 3/2016 | **අධ්‍යාපන සුදුසුකම්**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසයෙන් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන දෙකක් සහිතව විෂයන් 06ක් සමත් වී තිබීම.<br>සහ<br>**වෘත්තීය සුදුසුකම්**<br>පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.<br>සහ<br>**පළපුරුද්ද**<br>වාහන රියදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය. |

**තෝරා ගැනීමේ ක්‍රම වේදය:**
සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන්, සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

**වයස:** 2021.11.15 දිනට වයස අවුරුදු 45 ට අඩු විය යුතුය.

**බඳවා ගැනීමේ පදනම:** කොන්ත්‍රාත් පදනම මත මාස 07ක කාලයක් සඳහා බඳවා ගැනේ.

**මාසික වැටුප් පරිමාණය:**

- රු.38,685 + රජයේ අනුමත ජීවන වියදම් දීමනාව සහ කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2016 සහ 01/2016 (1) අනුව අතිකාල සහ යැපීම් දීමනා ගෙවනු ලැබේ.

**නියමයන් සහ කොන්දේසි:**

සියලුම අයදුම්පත්, යෝග්‍යතාව හා සුදුසුකම් සනාථ කිරීම සඳහා, අදාළ අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික පත්‍රවල පිටපත්ද, මෝටර් රථ පැදවීමේ බලපත්‍රයෙහි පිටපතක්ද සමඟ ව්‍යාපෘති අධ්‍යක්ෂ, සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය, මුදල් අමාත්‍යාංශය, කොළඹ 01 යන ලිපිනයට 2021.12.15 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. පමා වූ, අසම්පූර්ණ හෝ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනෙන් පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

අයදුම් කරන තනතුර, ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කළ යුතුය. මෙම දැන්වීම අවලංගු කිරීම,සංශෝධනය කිරීම,වෙනස් කිරීම හෝ අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය සේ සැලසිය යුතුය.

**නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය,කොළඹ 01.**
2021.11.29

**Source: www.treasury.gov.lk (2021.12.12)**